# එකොළොස්වන ශ්‍රේණියේ සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු විසඳීමට පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව දායකවන ආකාරය විමර්ශනය කිරීම

OUSL Library.
Donated by.
Dept. of
Secondary &
Tertiary.

ජේ.කේ.පී.ටී. හර්ෂණී

(විද්‍යාවේදී උපාධි, පශ්චාත් උපාධි අධ්‍යාපන අධ්‍යාපන ඩිප්ලෝමා, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා)

ලි:ප:අ: 216934691

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූරණය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයකි

ද්විතියික හා තෘතීයික අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

2022 -ඔක්තෝබර්

OPEN UNIVERSITY
74843

74843

## සංක්ෂිප්තය

අනාගත ජීවිතය හැඩගැස්වීමෙහි ලා සිසුන් සූදානම් කිරීමේ දී සිසුන්ට සිය පූර්ණ හැකියාවන් අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සඳහා විශේෂයෙන් ම පාසල් මාර්ගෝපදේශය හා උපදේශනය අත්‍යවශ්‍ය වේ. අප රටෙහි පාසල් සිසුන් සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව විවිධාකාරයෙන් දායක වේ. විශේෂයෙන් ම එකොළොස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු විසඳීමට පාසල් මාර්ගෝපදේශ හා උපදේශන ඒකකයෙන් ලබාදෙන දායකත්වය කෙසේදැයි සොයා බැලීම අරමුණු කොටගෙන නියැදි සමීක්ෂණ පිරිසැලසුම භාවිත කරමින් මෙම සමීක්ෂණාත්මක අධ්‍යයනය සිදු කරන ලදී.

වලස්මුල්ල කලාපයේ වලස්මුල්ල කොට්ඨාශයේ උපදේශනය හා මාර්ගෝපදේශ ඒකක සහ උපදේශනය භාර ගුරුවරු සහිත පාසල් පහක අහඹු ලෙස තෝරාගත් ශිෂ්‍යයන් 88 ක් සහ ශිෂ්‍යාවන් 187 ක් ලෙස සමස්ත සිසුන් 275 දෙනෙකුගෙන් ද පන්තිභාර ගුරුවරුන් 24 දෙනෙකුගෙන් ද පාසල් පහෙහි විදුහල්පතිවරුන් පස්දෙනා සහ උපදේශනය භාර ගුරුවරුන් පස්දෙනා ලෙස සමස්ත පුද්ගලයන් 309 දෙනෙකුගෙන් යුතු බහුවිධ නියැදියකින් ප්‍රශ්නාවලි මඟින් ද සම්මුඛ සාකච්ඡා මඟින්ද ලේඛනගත දත්ත මඟින් ද දත්ත රැස්කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රමාණාත්මක විශ්ලේෂණය ප්‍රතිශත, වගු සහ ප්‍රස්තාර භාවිතයෙන් ද ගුණාත්මක විශ්ලේෂණය සාරාංශගත, විස්තරාත්මක සහ ව්‍යුහගත සන්ධාර විශ්ලේෂණය මඟින් සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් තහවුරු වූයේ සෑම සිසුවෙක්ම පාහේ අධ්‍යාපනික ගැටලුවලින් පෙළෙන බවත් ඒවා පුම්තිරිබව අනුව වෙනස්වන බවත් එම අධ්‍යාපනික ගැටලු අවම කර ගැනීමට පාසල් මාර්ගෝපදේශ හා උපදේශන ඒකකයෙන් ලබාදෙන සහාය ඉතා අල්ප බවත් සෘජුව උපදේශන සහාය ලබාගත් සිසුන්ට ඵලදායී සහායක් ලැබී ඇති බවත් ය. සුදුසු නිගමනවලට එළැඹීමෙන් අනතුරුව සිසුන් මුහුණදෙන අධ්‍යාපන ගැටලුවලට මාර්ගෝපදේශ හා උපදේශන ඒකකයෙන් ලබාදෙන දායකත්වය සංවර්ධනය උදෙසා උපදේශනය හා සෘජුව සම්බන්ධවන අධ්‍යාපන ක්ෂේත්‍රයේ එක් එක් ස්ථරයන්ට යෝජනා ඉදිරිපත් කෙරෙනු ලැබිණි.



**මූලික පද : අධ්‍යාපනික ගැටලු, නව යොවුන්විය, උපදේශනය, පාසල් මාර්ගෝපදේශ හා උපදේශන ඒකකය**

## Abstract

School guidance and counselling is regarded as essential in having an indepth understanding about one's fullest potentials in moulding their future lives. Guidance and counselling programme helps in numerous ways in fulfilling the needs of the students in schools. This research study is carried on inorder to measure the assistance offered by the guidance and counselling service for the educational problems faced by the students in grade eleven.

This research was done using 187 female students, 88 male students, 24 class teachers, 5 principals and 5 counselling teachers taken from five 1AB schools in Walasmulla Educational Division. The sample of this research study was 309 individuals. Questionnaires, interviews and documentary evidences were manipulated inorder to collect data. Inorder to carry on the quantitative analysis percentages, tables and charts were utilized and the quantitative analysis was done based on summaries descriptive essays and structured compositions. The analysis justified that the majority of students were facing educational problems and it differs based opon their gender. It furthermore proved that the assistance given by the guidance and counselling unit in fulfilling the educational needs of grade eleven students is not sufficient.The students who got the direct assistance from the guidance and councelling unit succeeded in their education.

In the conclusion, suggestions were forwarded to the different stratas in the educational field which are having direct interrelationships with guidance and counselling, inorder to maximize the service done by the school guidance and councelling unit to overcome numerous problems, the students encounter in the field of education.

**Keywords: Adolescence, Educational problems, School guidance and counseling**